PAFFREL
නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.
சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.
PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

දිනේෂ් ගුණවර්ධන මැතිතුමා,
මැතිවරණ ක්‍රමයේ සංශෝධනයන් පිළිබඳ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ ගරු සභාපති ,
ජනරජ ගොඩනැගිල්ල ,
ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
කොළඹ 01.
2021-06-07

ගරු අමාත්‍යතුමනි,

<u>මැතිවරණ ක්‍රමයේ සංශෝධන පිළිබඳව සොයා බැලීමට පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත්කිරීම</u>

මැතිවරණ සහ ඡන්ද විමසීම් ව්‍යුහය නීති රීති ප්‍රතිසංස්කරණය සම්බන්ධයෙන් සොයා බලා සංශෝධන ඉදිරිපත් කිරීම වෙනුවෙන් පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත්කිරීම දිගුකාලයක සිට සමාජය ඉල්ලා සිටි කාලීන අවශ්‍යතාවයකට ඉඩ ප්‍රස්ථා විවර කිරීමක් බව අප විශ්වාස කරමු .

මැතිවරණ ක්‍රමයේ සංශෝධන වෙනුවෙන් උනන්දුවක් දක්වන සංවිධාන හෝ පුද්ගලයින්ට තම යෝජනා හා අදහස් ඉදිරිපත් කිරීම සඳහා 2021 ජූනි මස 19 වන දින දක්වා කාලසීමාව ලබාදී ඇතත් කොරෝනා වසංගත තත්වය හමුවේ මේ පිළිබඳව ජනතාවගේ ප්‍රමාණවත් අවධානයක් යොමු වේදැයි සැකසහිත වාතාවරණයක් රටතුළ නිර්මාණය වී තිබේ.

හැකි උපරිමයෙන් ජනතා අභිලාෂයන් නියෝජනය වන මැතිවරණ ක්‍රමයක් සැකසීමට නම් ඒ සඳහා නිරවුල් මනසකින් යුතුව සංවාද කිරීමටත් එකී සංවාදයන් හරහා වඩා දියුණු ලක්ෂණ වලින් සමන්විත මැතිවරණ ක්‍රමවේදයක් සකස් කරගැනීමත් ප්‍රමාණවත් කාලසීමාවක් අවශ්‍ය බවට විවාදයක් නැත. නමුත් කොරෝනා වසංගතය ඉතාමත් අවාසනාවන්ත අයුරින් සියලු ප්‍රමුඛතාවයන් පසෙකට දමා තම ජීවිත බේරාගැනිම වෙනුවෙන් වන වෙනස්ම ආකාරයේ අරගලයකට ජන ජීවිත ඇද දමා තිබේ.

ශ්‍රී ලංකාවේ පුමුඛතම මැතිවරණ නිරීක්ෂණ සංවිධානය ලෙස අප හටද දිස්ත්‍රික් මට්ටමින් සංවාද පවත්වමින් වෙනදා සිදුකල අයුරින් පුරවැසියන්ගේ යෝජනා තේරීම්

#No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06.
Tel : (+94) 11 2558570 / 11 2558571 Fax : (+94) 11 2558572
Email : paffrel@sltnet.lk Web : www.paffrel.com

කාරක සභාව වෙත ලබාදීමට කොරෝනා වසංගත තත්ත්වය ප්‍රබල බාධාවක් වී තිබේ. මෙය මෙවැනි දරුණු ගෝලීය වසංගත තත්වයක් තුළ අපට පමණක් නොව උනන්දුවක් දක්වන සියලු, සංවිධානවලටද එකසේ බලපාන අභියෝගයකි

උක්ත කරුණු පිළිබඳව ඔබතුමාගේ කාරුණික අවධානය යොමුකර කොරෝනා වසංගත තත්ත්වය යම් මට්ටමකට පාලනය , වනතෙක් මහජන අදහස් ලබාගැනීමේ කර්තව්‍යය ප්‍රමාද කරන ලෙසත් එසේ කල නොහැකි වන්නේ නම් පුරවැසියන්හට ප්‍රමාණවත් සාධාරණ කාලසීමාවක් ලබාදීම කෙරෙහි ඔබ තේරීම් කාරක සභාවේ අවධානය යොමුකරන ලෙසත් ඉතා කාරුණිකව ඉල්ලා සිට්මි.

රෝහණ හෙට්ටිආරච්චි ,

විධායක අධ්‍යෂක .